# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1861/2 - 2014 මැයි මස 05 වැනි සඳුදා - 2014.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස - (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් හා 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීම.

පනතේ 29 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද යම් කෘෂි කාර්මික ඉඩමක් හෝ ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම ඉඩම හෝ ඉඩම් සම්බන්ධයෙන් සම්බන්ධතාවයක් දැරූ සෑම තැනැත්තෙකුම, වර්ෂ 2014.06.05 දින සිට මසක් ඇතුලත එම ඉඩම සම්බන්ධයෙන් එම පනත යටතේ ගෙවිය යුතු මුළු වන්දිය හෝ ඉන් කොටසක් සඳහා තෙපිටපතකින් යුතු ලිඛිත හිමිකම් පෑමක්ද ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරන අතර, එම හිමිකම් පෑමෙහි පහත සඳහන් විස්තර දැක්විය යුතු යැයි නියම කරමි.

(අ) හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය :-
(ආ) එම ඉඩමෙහිලා ඔහුගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය :-
(ඇ) ඔහුගේ හිමිකම් පෑමෙහි විස්තර ; සහ
(ඈ) ඒ වන්දියෙන් ඔහු හිමිකම්පාන ප්‍රමාණය

සියළු හිමිකම් පෑමක්ම ලියා පදිංචි තැපෑලෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කල යුතු බව දන්වනු කැමැත්තෙමි.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2014 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු අංකය | විශේෂ අංකය | ප්‍රකාශකගේ නම | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ගම | පැවරෙන ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | කො/3436 | නැසීගිය මුහන්දිරම් දොන් තේමිස් කරුණාතිලක මහතා | කොඩිතුවක්කු පංගුව නොහොත් කොඩිප්පිලි කන්ද | රත්නපුර | ජාතුවන්ගොඩ | 150 | 0 | 00 |

05 - 565/1

# සංශෝධනය

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වැනි වගන්තිය යටතේ පළ කරන ලද ගැසට් නිවේදනය සංශෝධනය කිරීම.

1986.06.23 දින අංක 407/4 හා 1987.01.16 දින අංක 436/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රවල සඳහන් කො/1409 යටතේ පළ කරන ලද දැන්වීම ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් දැන්වීම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

උපලේඛනය

| ඉ.ප්‍ර.කො. සභාවේ විශේෂ අංකය | ප්‍රකාශකගේ නම | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ගම | ඉ.ප්‍ර.කො. සභාවට පැවරෙන ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අ. | රූ. | පර්. |
| කො/1409 | සී/ස හැරින්ටන් තේ වතු සමාගම | හැරින්ටන් එස්ටේට් | නුවරඑළිය | කොටගල | 232 | 3 | 37 |

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,<br>
සභාපති,<br>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2014 අප්‍රේල් මස 28 වැනි දින,<br>
කොළඹ 07,<br>
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,<br>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

05 - 565/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.